{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாண கல்வித்திணைக்கலாம் - வடமத்திய மாகாணம்
Department of Education – North Central Province

13 - ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | කාලය : පැය දෙකයි

විෂයය :- පෙරදිග සංගීතය I 54 S
පාසලේ නම :- ........................................
ඇතුළත්වීමේ අංකය :- ........................................

**උපදෙස් :- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සැපයිය යුතු යි.**

- **අංක 1 සිට 30 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ ඉතාම ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහන තුළ ලියන්න.**

(1) සමප්‍රකෘති රාග යුගලයක් ඇතුළත් වරණය වන්නේ,
1. බිහාග් - තිලක්කාමෝද් 2. හංස ධ්වනි - භෛරව 3. ආසාවරි - ජෞන්පුරි
4. දේස් - කාලිංගඩා 5. ආසාවරි - භෛරව (..........)

(2) පූර්වාංගයට හා උත්තරාංගයට පොදු වූ ස්වර යුගලය වශයෙන් ගායන සමයේදී අදාළ වන ස්වර ද්විත්වය වනුයේ,
1. ස - ප 2. ම - ප 3. ස - ම 4. ම - ස 5. ප - ස (..........)

(3) පහත සඳහන් ස්වර ඛණ්ඩ අතරින් වක්‍ර ස්වර යෙදී ඇති ස්වර ඛණ්ඩය තෝරන්න.
1. ස ස රි ග ම ප 2. රි ග ම ප ධ නි 3. ස නි ධ ප ම ග
4. ග රි ග ප ග ප 5. රි ග ප ධ නි (..........)

(4) සදාරංග සහ අදාරංග යන සංගීතඥයින් විසින් ප්‍රබන්ධිත උතුරු ඉන්දීය ගායන ශෛලීන් ලෙස සැලකෙන්නේ,
1. භජන් හා ගzසල් 2. තරානා හා ධුම්රි 3. චොටා ඛ්‍යාල් හා බඩා ඛ්‍යාල්
4. ධෘපද් හා ධමාර් 5. කව්වාලි හා ඨප්පාගී (..........)

(5) ධෘපද් ගායනය පිළිබඳව දැක්වෙන අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
1. හින්දුස්ථානි සංගීත සම්ප්‍රදායේ ආදීතම ගායන ශෛලියකි.
2. ස්ථායි, අන්තරා, සංචාරී, අභෝග යන කොටස් 4ම භාවිතා කර ඇත.
3. තාල වාදනය සඳහා පක්වාජ් භාණ්ඩය යොදා ගෙන ඇත.
4. සම, දෙගුණ, තුන්ගුණ හා සිව්ගුණ වශයෙන් ගුණ කෙරේ.
5. ඒක් තාලයට අනුව ගායනා කෙරේ. (..........)

- **අංක 06 සිට අංක 09 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත ස්වර ප්‍රස්ථාරය උපයෝගී කරගන්න.**

ප ස ස ස ස / රි ම ප ධ / ම ප ස නි / ධප මප මග රි - /

(6) ඉහත සඳහන් ස්වර ඛාණ්ඩයෙන් පිළිඹිබු වන රාගය කුමක් ද?
1. හංස ධ්වනි 2. ජයජයවන්ති 3. කාලිංගඩා 4. ආසාවරී
5. තිලක්කාමෝද් (..........)

(7) ස්වර ප්‍රස්ථාරයේ පළමු විභාගයෙන් දැක්වෙන ස්වර සංගතිය අයත් වන්නේ,
1. ආරෝහී වර්ණයට ය. 2. අවරෝහී වර්ණයට ය. 3. ස්ථායී වර්ණයට ය.
4. සංචාරී වර්ණයට ය. 5. ආරෝහී හා සංචාරී වර්ණ දෙකටම ය. (..........)

(8) ඉහත ස්වර ප්‍රස්ථාරයේ පළමු විභාගයේ පළමු ස ස්වරයට වම් පස ඉහළින් පිහිටා ඇති ස්වරය හඳුවන්වනු ලබන්නේ,

1. මූර්කි ස්වරයකි  2. කණ් ස්වරයකි  3. ගමක් ස්වරයකි
4. ආන්දෝලිත ස්වරයකි  5. මීන්ඩ් ස්වරයකි  (..........)

(9) මෙම ස්වර ප්‍රස්ථාරයෙන් කියැවෙන රාගය ඇතැම් ගරානා වල (ගුරු කුළ වල) ගායනය වාදනය කරන විට,

1. ශුද්ධ ගාන්ධාරය යොදා ගයනු වයනු ලබයි.
2. ශුද්ධ ධෛවකය යොදා ගයනු වයනු ලබයි.
3. තීව්‍ර මධ්‍යමය යොදා ගයනු වයනු ලබයි.
4. කෝමල රිෂභය යොදා ගයනු වයනු ලබයි.
5. ශුද්ධ නිශාදය යොදා ගයනු වයනු ලබයි.  (..........)

(10) රාග ගායනයේ දී ගායන දෝෂයක් ලෙස නොනැගෙන්නේ මින් කුමක් ද?

1. තමාට රිසි ඉරියව්වකින් හිඳ ගැනීම
2. දෙනෙත් පියා ගනිමින් ගැයීම
3. ඉතා ශබ්දයෙන් දෑත් චලනය කරමින් ගැයීම
4. ශරීරය ඍජුව සමබරව තබා ගනිමින් ගැයීම.
5. කටහඬ වෙව්ලමින් ගැයීම.  (..........)

(11) ශුද්ධ හා කෝමල ගාන්ධාර දෙකම භාවිතා කරනු ලබන පූර්වාංගවාදී රාගයක් ලෙස ගනු ලබන රාගය වන්නේ,

1. භෛරව  2. කාලිංගඩා  3. ජයජයවන්ති  4. භාගේශ්‍රී
5. තිලක්කාමෝද්  (..........)

(12) කර්ණාට සංගීත සම්ප්‍රදායේ අභාසය ලද හා ථාට 2 කින් උපත ලදැයි මත බේදයට තුඩුදුන් රාගයක් ලෙස ගැනෙනුයේ,

1. තිලක්කාමෝද්  2. ජයජයවන්ති  3. හංස ධ්වනි  4. භාගේශ්‍රී
5. භෛරව  (..........)

(13) හින්දුස්ථානී හා කර්ණාටක සංගීතය වශයෙන් භාරතීය සංගීතය පද්ධති දෙකක් වශයෙන් බිහි වූයේ,

1. බටහිර ජාතීන්ගේ බලපෑමට යමක් වූ පසු ය.
2. සංගීත අධ්‍යාපන ආයතන බිහිවීමෙන් පසුව ය.
3. ඉන්දීය ජන සංගීතයේ බලපෑම හේතු වීමෙන් ය.
4. මෝගල් අධිරාජ්‍යයේ බලපෑමෙන් පසුව ය.
5. දේව ඇඳහිල්ල මත ගොඩනැගුණු ඇඳහිලි ක්‍රම හේතු වීමෙන් ය.  (..........)

(14) වයලීනය හා සිතාරය යුගල වාදනයේ යොදා ගනිමින් ලෝක ප්‍රකට වාද්‍ය වෘන්ද ඉදිරිපත් කළ අපරදිග හා පෙරදිග වාද්‍ය ශිල්පීන් දෙදෙනෙකු වන්නේ,

1. ජෝස් මැසීඩා සහ චෞරසියා ය.  2. මෝසාර්ට් සහ අලව්දීන් ඛාන් ය.
3. බේතෝවන් සහ වී.ජී. ජෝග් ය.  4. සෙබස්තියන් බාක් සහ බිස්මිල්ලා ඛාන් ය.
5. යෙහුදි මෙන්හුයින් සහ රවිශංකර් ය.  (..........)

(15) තත් වාද්‍ය භාණ්ඩයක තතක් පෙලා ස්වරය නිපදවීමේ දී කම්පන තරංග නැවත නැවත ඇතිවීම හඳුන්වන්නේ,

1. ධ්වනිය නමිනි  2. තරංග නමිනි  3. උපරිතානය නමිනි
4. කම්පනය නමිනි  5. විස්තාරය නමිනි  (..........)

(16) ගත්, පරන්, රේලා යන පාරාභාෂික වචන 3 ම හමුවන්නේ කුමන වාද්‍ය භාණ්ඩයක් සම්බන්ධව ද?

1. වීණාව  2. සටම්  3. තබ්ලා  4. සිතාර්  5. තවිල්  (..........)

(17) එස්රාජ්, සාරංගි, දිල්රුබා යන සංගීත භාණ්ඩ 3 ටම පොදු ලක්ෂණය කුමක් ද?

1. භාණ්ඩ තුනටම පර්දා පිහිටා තිබීම.
2. එකම ධ්වනි ගුණයකින් යුක්ත වීම
3. කාන්තාවන් විසින් බහුලව භාවිතා කිරීම.
4. බෝ එක මඟින් වාදනය කිරීම
5. භාරතීය සංගීතයේ වාද්‍ය භාණ්ඩ වීම. (..........)

(18) චෞ තාලය හා ධමාර් තාලය භාවිතා කරන ගායන ශෛලීන් පිළිවෙලින් ඇති වරණය තෝරන්න.

1. ධෘපද් හා ඛ්‍යාල් ගායනය
2. ධමාර් හා ධෘපද් ගායනය
3. ඛ්‍යාල් හා ධමාර් ගායනය
4. භජන් හා ධෘපද් ගායනය
5. ධෘපද් හා ධමාර් ගායනය (..........)

- **පහත දැක්වෙන්නේ ගැමි ගී පාද 5 කි.**
    - a) සබරගමුව එළියයි පෙරහැරදාට
    - b) දේවතා දූවක් ඇවිදින් කියන්නේ
    - c) කොළඹ සිටන් නා තම්දෙන තානම්
    - d) බැද්ද වටට සුදු මොර මල් පිපීලා
    - e) අවර උදය පායන හිරු දෙවිගේ වරම්

(19) ඉහත ගැමි ගී පාද අතුරින් ගැමියා තම විවේක කාලය විනෝදයෙන් ගත කිරීමට ගායනා කරන ලද හා ගැමි සාරධර්ම විදහා පාමින් ගයනු ලැබූ ගීත පාද ඇතුළත් වරණය වන්නේ,

1. c හා d  2. b හා c  3. a හා e  4. c හා e  5. d හා e (..........)

පහත සඳහන් ගීත ප්‍රස්ථාරය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

ප ප ප / ස ස ස / ස - ස / ග රි ස /
නි - නි / ස රි - / - - - / - - - /

(20) මෙම ස්වර පාදයට අයත් ගී මත් ගණන හා පූර්ණ යතියට හිමි මාත්‍රා ගණන වන්නේ,



1. 24 හා 7 කි
2. 22 හා 6 කි
3. 15 හා 9 කි
4. 14 හා 5 කි
5. 24 හා 8 කි. (..........)

(21) දෙතිසක් තාල ගනන්ද - රාගත් එම ගනනින් ද
අබිනත් සුවිස්සෙන් ද - සවිදම් සිව් සැටකී

මෙම ප්‍රබන්ධය ඇතුළත් ග්‍රන්ථය ලෙස සැලකෙන්නේ,

1. නෘත්‍ය රත්නාකරය
2. ජන සංගීත සිද්ධාන්ත
3. විශ්ව සංගීත ක්ෂේත්‍ර
4. ශිෂ්‍ය ගීත
5. නාද මියැසිය (..........)

(22) අංක 22 -23 ප්‍රශ්නවලට පහත සඳහන් රූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.


| A | B | C | D |
|---|---|---|---|
|  |  |  |  |

1. 1. String  2. Wood wind  3. Percussion  4. Brass
2. 1. Brass  2. Wood wind  3. Percussion  4. Brass
3. 1. Wood wind  2. Brass  3. Percussion  4. String
4. 1. String  2. Brass  3. Percussion  4. Brass
5. 1. Brass  2. Wood wind  3. Percussion  4. Brass

(23) පාසල් අපරදිග තූර්ය වාදක කණ්ඩායමක් තුළ දක්නට ලැබෙන භාණ්ඩ 2 ක් වන්නේ,

1. A හා B  2. B හා D  3. B හා C  4. C හා D  5. A හා C (..........)

(24) බටහිර සංගීත ප්‍රස්ථාරකරණයට අනුව time signature (ටයිම් සිග්නේචරය) දැක්වෙන සංකේතය කුමක් ද?




1. C  2. A  3. B  4. E  5. D  (..........)

(25) ''වාදාංකුස රත්නමාලය'' ග්‍රන්ථය ඇසුරෙන් රචනා කරන ලද ගීත විශේෂය ලෙස සලකනු ලබන්නේ,
1. නාඩගම්  2. වන්නම්  3. හටන්  4. ප්‍රශස්ති  5. සොකරි  (..........)

(26) මුලින් ම නිෂ්පාදනය කරන ලද නූර්තිය ලෙසට හඳුන්වන්නේ.
1. රොලීනා  2. ඇහැලේපොළ  3. සිරිසඟබෝ  4. රෝමියෝ ජුලියට්
5. බැලසන්ත  (..........)

(27) ඨුම්රි, ගසල්, ධූන්, භජන්, වැනි සරල ශාස්ත්‍රීය ගායන වාදන ශෛලීන්ට අනුව සැකසුන සිංහල සරල ගීතයක් වන්නේ,
1. හංසරාජිනි  2. මම දෙව්ඳුනි  3. මාරම්භරී
4. දුරස් වන්නට මේ ලෙසින්  5. ගෝපල වනපෙත  (..........)

(28) අධ්‍යාපන කාරකයක් ලෙස ගැමියා විසින් ගැමි ගී යොදා ගත් අවස්ථා පිළිඹිබු කරන්නේ,
1. පැල් ගී වලිනි  2. ගොයම් ගී වලිනි  3. කුරහන් තලප ගී වලිනි
4. පාරු ගී වලිනි  5. ගැල් ගී වලිනි  (..........)

(29) $\hat{1}$ 2 / $\acute{1}$ 2 3 / $\hat{1}$ 2 / $\acute{1}$ 2 3 මෙම තිත් රූපයෙන්,
1. දෙතිතේ තිත් රූපයක් පෙනේ.  2. තනි තිතේ තිත් රූපයක් පෙනේ.
3. තුන් තිතේ තිත් රූපයක් පෙනේ.  4. සිව් තිතේ තිත් රූපයක් පෙනේ.
5. නොගැළපෙන තිත් රූප 07 ක් පෙනේ.  (..........)

(30) පරිඝනකය යොදා ගනිමින් The Silk Road නමින් කළ සංගීත නිර්මාණයේ නිර්මාතෘවරයා වන්නේ,
1. කිටාරෝ  2. ජෝන් ෆීල්ඩ්  3. බේතෝවන්  4. මෝසාර්ට්
5. ෂූ බර්ට්  (..........)

- **31 සිට 50 තෙක් ප්‍රශ්නවල ඇති හිස්තැන් සඳහා සුදුසු ම පිළිතුර යොදන්න.**

(31) 1944 ඔක්තෝබර් 02 වැනි දින අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන සංගීත පරීක්ෂකවරයා ලෙස පත් වූ ........................................................................................ මහතා මුල් කාලයේ .................................................................. නමින් ජාතික ගීයක් ද ඉදිරිපත් කර ඇත.

(32) සාමවේදය තුළ ගයන ලද ස්වර ........................................... ක් වන අතර, එම ස්වර ........................ , ........................................ , ................................ නමින් හඳුන්වනු ලබයි.

(33) අපරදිග සංගීතයෙහි ස්කේල් සිද්ධාන්තයට හා සමාන වන්නේ රාගධාරී සංගීතයේ ........................ හෙවත් ...................................... යි.

(34) සංගීත ශාස්ත්‍රය පිළිබඳ ව ලියැවුණු පැරණිත ම ග්‍රන්ථය ...................................... වන අතර, .................................................... පඬිතුමා විසින් අද අප භාවිතා කරන ප්‍රස්ථාර ක්‍රමය හඳුන්වා දී ඇත.

(35) ''තතීම් තාත්‍රක තීම් ත්‍රොම් තීමිත'' යනුවෙන් ....................................................... ගායන ශෛලිය ද ''තන දෙරෙ නා දීමිත'' යනුවෙන් ...................................................... ගායන ශෛලිය ද ගයනු ලබයි.

(36) ඛමාජ් ඨාටයෙන් උපත ලද ........................................................... රාගයේ සමප්‍රකෘති රාගය ......................................................... රාගයයි.

(37) ගී පද, සර්ගම්, .......................................... , තරානා අංග සියල්ල ඇතුලත් ගායනා ශෛලිය ................................................................ නමින් හඳුන්වයි.

(38) දක්ෂින භාරතීය සංගීතයේ ප්‍රධාන තත්වාද්‍ය භාණ්ඩය ලෙස .............................. සැලකෙන අතර, තාල වාද්‍ය භාණ්ඩය ලෙස ගැනෙන්නේ ........................................... යි.

(39) දේශීය තිත් තාල පද්ධතියට අනුව තනි තිතේ තිත් ප්‍රභේද .................................. ක් ඇති අතර දෙතිතේ තිත් ප්‍රභේද සංඛ්‍යාව ..................................... කි.

(40) පෙර අපර දෙදිග බහු භාවිතයේ පවතින තත් වාද්‍ය භාණ්ඩයක් වන ..................................... අපරදිග සංගීත ක්‍රමයට අනුව ............................ වශයෙන් සුසර කර ගනු ලබයි.

(41) අනුරූපන මාධ්‍යයෙන් කථාවක් කීම .................................... සම්ප්‍රදායේ ලක්ෂණයක් වන අතර, .......................................................... දෙවියන් හා සම්බන්ධ ය.

(42) මෙරට ප්‍රථම වර්ණ චිත්‍රපටය ...................................... වන අතර, සංගීත නිර්මාණය කරනු ලැබුයේ ....................................................... විසිනි.

(43) පූර්වාංගය හා ......................................... වශයෙන් රාගධාරී සංගීතයේ දී භාවිතා වන කොටස් බටහිර සංගීතයේ දී upper Tetro chord හා ................................... වශයෙන් වෙන් කොට භාවිතා කරයි.

(44) ශ්‍රී ලාංකීය සංගීතයේ මනස්කාන්ත යුගය ලෙස සැලකෙන .......................................... රාජ සමය නාඩගම් සම්ප්‍රදායේ ද ආරම්භය ........................................ නාඩගමින් සනිටුහන් කර ඇත.

(45) නාද තරංග රටා සහ හැඩ විශ්ලේෂණය සඳහා ..................................... උපකරණය භාවිතා කරනු ලබන අතර, හඬ පටිගත කිරීමක දී ව්‍යවහාරික සංගීත භාණ්ඩයක් වෙනුවට භාවිතා කළ හැකි ........................................... පරිඝනක මෙවලමකි.

(46) පක්වාජයෙන් වාදනය වන ...................................... මාත්‍රා ගණන හා සමාන ව තබ්ලාවෙන් වාදනය කරන ලබන ....................................................................... තාලය උත්තර භාරතීය සංගීත සම්ප්‍රදායට අයත් තාල පද්ධතියට අයත් තාලයෝ ය.

(47) W.B. මකුලොලුව මහතා විසින් රචිත ................................. කෘතිය දේශීය ජන සංගීතයට අදාළ ව රචනා කර ඇති අතර, සී. ද එස් කුලතුංග මහතා විසින් රචිත .............................. කෘතියෙන් ශ්‍රී ලංකාවේ සංගීතයේ ආදිතම තොරතුරු අන්තර්ගත කර ඇත.

(48) ආචාර්ය ප්‍රේමසිරි කේමදාසයන් විසින් ශ්‍රී ලාංකේය ඔපෙරා නිර්මාණකරණයේ දී ........................... හා ...................................... දායාද කර ඇත.

(49) බහුවිධ බුද්ධිය පිළිබඳ සිද්ධාන්තය ඉදිරිපත් කළ ........................................... විසින් 1997 දී බුද්ධි වර්ග ..................................... ක් තුළ රිද්මයානුකූල බුද්ධිය මගින් සංගීත පරිකල්පනය සිදුවන අයුරු දක්වා ඇත.

(50) නූර්ති සංගීතයට ............................................. වැනි රාග අභාසය ලබා ගෙන සංගීත නිර්මාණය සිදු කර ඇති අතර කරහරප්‍රිය, හරිකම්භෝජ වැනි රාග ඇසුරු කර ගනිමින් ................................................ සම්ප්‍රදාය බිහි වී ඇත.

{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாண கல்வித்திணைக்களம் - வடமத்திய மாகாணம்
Department of Education – North Central Province

| 13 - ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | කාලය : පැය තුනයි විනාඩි 10 |
|---|---|---|

විෂයය :- පෙරදිග සංගීතය II 54 S

පාසලේ නම :- ..............................................

ඇතුළත්වීමේ අංකය :- ..............................................

**I කොටසින් ප්‍රශ්න 2 කට ද, II කොටසින් 1 ප්‍රශ්නයකට ද, III කොටසින් ප්‍රශ්න 2 කට ද වශයෙන් ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න. (සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් හිමිවේ.)**

## I කොටස

01. පහත දැක්වෙනුයේ නිර්දේශිත රාග හතරකට අයත් ස්වර සංගති කිහිපයකි.

A. - රි ම ප ධ , ම ප ධ ස̇ , නි ධ ප -
B. - නි̣ නි̣ ස , රි ග රි ස , ධ̣ නි̣ රි , ස
C. - ග ප ග රි , ග ප නි ප ග ස
D. - ස රි ම රි , ම ප නි , ස̇ , නි ධ , ප ම ග රි ග ස

I. ඉහත රාග හතර හඳුනාගෙන අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමඟ පිළිවෙළින් නම් කරන්න. (ල.04)

II. එම රාග අතුරින් බිලාවල් ථාට ගත රාගයේ මධ්‍යලය ගීතයේ හෝ වාදිතයේ ස්ථායී කොටස ස්වර ප්‍රස්ථාර කරන්න. (ල.08)

III. ඉහත රාග 4 ට අදාළ වාදී, සංවාදී ස්වර ලියා දක්වන්න. (ල.08)

02. නිර්දේශිත රාග 3 කට අදාළ ව විස්තර සපයා ඇති පහත සඳහන් වගුවේ A සිට F දක්වා ඇති හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමඟ ලියා දක්වන්න.

I.

| රාගය | මේලය | ගාන සමය | මුඛ්‍යාංගය |
|---|---|---|---|
| භෛරව | භෛරව | A. .................................. | B. .................................. |
| C. ......................... | ආසාවරි | D. .................................. | රි ම ප , නි ධ ප |
| E. ......................... | F. .................................. | දිවා දෙවන ප්‍රහරය | ම ප , නි ධ ප , ධ , ම ප ග , රි ම ප |

(ල.06)

II. ඉහත වගුවට අනුව සම ප්‍රකෘති රාග දෙක නම් කරන්න. (ල.02)

III. මෙයින් C අක්ෂරයෙන් පිළිඹිබු වන රාගයේ මධ්‍යලය ගීතයෙහි හෝ වාදිතයෙහි අන්තරා කොටස ස්වර ප්‍රස්ථාර කරන්න. (ල.08)

IV. භෛරව රාගයේ විශේෂ ලක්ෂණ 4 ක් ලියා දක්වන්න. (ල.04)

03. I. ඔබ විෂය නිර්දේශයට අයත් කැමති රාගයකින් විලම්භිත් ඛ්‍යාල් ගීතයක/ වාදිතයක ස්ථායී කොටසේ ගීත ස්වර ප්‍රස්ථාරය ලියා දක්වන්න. (ල.08)

II. ඊට අදාළ ව මාත්‍රා 8 කට නොඅඩු මිශ්‍ර තාන 1 ක් ඇතුළුව තානාලංකාර දෙකක් ලියා දක්වන්න. (ල.04)

III. එම රාගයට අදාළ ව පූර්ව ආලාප ඛණ්ඩ 04 ක් ලියා දක්වන්න. (ල.04)

IV. ඔබ තෝරාගත් රාගයේ ආරෝහණ, අවරෝහණ, වාදී, සංවාදී, ථාටය, ගාන සමය ලියා දක්වන්න. (ල.04)

## II කොටස

04\. I. ගෝත්‍රික ගීත වශයෙන් වැදි ගීයක ගීත ස්වර ප්‍රස්ථාරය පේළි 2 කින් ලියා එහි ස්වර ක්ෂේත්‍රය පැතිරී ඇති ස්වර පරාසය සැලකිල්ලට ගනිමින් එහි පද මාලාව, නාද මාලාව, ගායනය පිළිබඳ ව සංසන්දනාත්මක කරුණු 3 ක් ඉදිරිපත් කරන්න. (ල.06)

II. මහා සංගීත සම්ප්‍රදායක් දක්වා වර්ධනය වීමට ගෝත්‍රික ගී ඉවහල් වූ ආකාරය උතුරු ඉන්දීය සංගීත සම්ප්‍රදාය හෝ ගැමිලෑන් සංගීත සම්ප්‍රදාය පාදක කොට ගනිමින් කරුණු දක්වන්න. (ල.06)

III. නූතන සරළ ගී නිර්මාණයට වැදි ගී පදනම් වී ඇති ආකාරය ව්‍යවහාරික සංගීතයට කොතරම් බලපෑමක් ඇති කර ඇත්දැයි උදාහරණ සපයමින් විග්‍රහ කරන්න. (ල.08)

05\. I. මුල් කාලයේ කොළපත් වෙස්මුහුණු පළඳා රඟ දක්වන ලද ....................................... නාට්‍ය සම්ප්‍රදාය ................................ ප්‍රදේශයේ ප්‍රධාන වූවකි. වෙස් මුහුණු පැළඳ රඟ දක්වන ....................................................... නාට්‍ය සම්ප්‍රදාය හොරණෑව සහ ................................. එක්ව වයන එකම රංගන සම්ප්‍රදායයි. ......................................... කෘතියෙහි මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන් විසින් මේ පිළිබඳ තොරතුරු දක්වා ඇත. (ල.05)

II. කෝළම් රංග සම්ප්‍රදායේ සහ සොකරි රංග සම්ප්‍රදායේ දැක්විය හැකි ශාන්ති කර්ම අංග 03 ක් සඳහන් කරන්න. (ල.06)

III. a. තෝඩායම, ඉන්නිසිය, පොතේ සින්දුව

b. මං ලෙස සොබනා, පෙර සිට පැවත එන


c. මනමේ, නරිබෑණා, සිංහබාහු

ඉහත සඳහන් එක් එක් ඉංග්‍රීසි අක්ෂරය යටතේ ඇති රංග සම්ප්‍රදායන් 3 නම් කරන්න. (ල.06)

IV. ඉහත b තීරුව යටතේ ඇති රංග සම්ප්‍රදායන් හි සංගීතමය ලක්ෂණ 03 ක් ලියන්න. (ල.03)

## III කොටස

06\.




I. ඉහත අපරදිග ස්වර ප්‍රස්ථාරයට අයත් ටයිම් සිග්නේචරය (Time Signature) ලියන්න. (ල.02)

II. මූලික ශ්‍රැති ස්වරය (Tonic note) අපරදිග "C" ස්වරය ලෙස සිතා ඉහත අපරදිග ස්වර ප්‍රස්ථාරය පෙරදිග ක්‍රමයට ප්‍රස්ථාර කරන්න. (ල.04)

III. ඉහත ප්‍රස්ථාරය අයත් ස්කේලය (Scale) නම් කර එම ස්කේලයට අයත් ස්වර පිළිවෙලින් ලියා දක්වන්න. (අපරදිග ක්‍රමයට) (ල.02)

IV. ඉහත ප්‍රස්ථාරයේ දැක්වෙන ප්‍රකාශන සංකේත 4 ක් නම් කර ඒවා විස්තර කර දක්වන්න. (ල.04)

V. පහත දැක්වෙන ස්වර පාද දෙකට ගැළපෙන බටහිර සංගීත කෝඩ්ස්, ප්‍රස්ථාරයට අදාළ ලෙස විභාග යටතේ සළකුණු කරන්න.

සප ගප ග ප/මධ මරි ධ සං /සං - ධම ධධ/නිප -ප නි රිං /

සං - ධම ධප/ ප ග ස ග/පස - නිරි ස / ස - - - /


(ල.08)

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

07. I. ගායනයක්/ වාදනයක් ඉදිරිපත් කිරීමේ දී නිවැරදි ඉරියව් භාවිතා නොකිරීම තුළින් සිදු වියහැකි බලපෑම් 04 ක් හා නිවැරදි ඉරියව් භාවිතා කිරීම තුළින් ඇතිවන බලපෑම් 04 ක් ලියන්න.

(ල.08)

II. පහත සඳහන් ස්වරාලයේ රූප සටහන පාදක කරගනිමින් ගායනයේ දී ස්වරාලය ක්‍රියාත්මක වන අයුරු දැක්වෙන ලිපියක් සකස් කරන්න. (ල.08)



III. ගායන හැකියා වර්ධනය කර ගැනීමට ස්වරාලය හැසිරවීමේ පුහුණුව සඳහා සුදුසු අභ්‍යාස 04 ක් ගොඩ නඟන්න. (ල.04)

08. I. a. ජොහාන් සෙබස්තියන් බාක් සංගීතඥයා විසින් සිදු කළ සංගීත නිර්මාණ 2 ක් නම් කරන්න.

(ල.02)

b. අප්‍රිකානු රටවල එදිනෙදා භාවිතා වන සම්ප්‍රදායික සංගීත භාණ්ඩ 02 ක් සඳහන් කරන්න.

(ල.02)

II. පහත මාතෘකා අතුරින් දෙකක් පිළිබඳ ව උදාහරණ සහිතව කෙටියෙන් විස්තර කරන්න.

a. මුල් යුගයේ දේශීය චිත්‍රපට සඳහා ලද දකුණු ඉන්දීය අභාසය

b. දීප්චන්දි තාලය හා ඡප් තාලය අතර ඇති ගති ලක්ෂණ උදාහරණ දක්වමින් පෙන්වා දෙන්න.

c. ශ්‍රැතිය, ස්වර, ස්වර පරාසය, Scale නිර්මාණයක දී වැදගත් වන අයුරු උදාහරණ සහිතව පහදන්න.

(ල.08)

III. මනස සුවපත් කිරීමෙහිලා සංගීත චිකිත්සාව පිළිබඳ උදාහරණ සහිත ව විස්තර කරන්න.

(ල.08)



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න






කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

## සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න